" විශිෂ්ට රාජ්‍ය සේවාවක් සඳහා අැප කැපවෙමු "
ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE
204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk
පොදු දුරකථන / தொலைபேசி இலக்கம் / General Telephone - 011 - 2093000

SLSI ISO 9001 SYSTEM CERTIFIED
SLAB ACCREDITED ISO/IEC: 17021 QMS-001-01

| මගේ අංකය / எனது இலக்கம் / My No. | CSWP/PTR/**18-6**/FI/1(C) | ඔබේ අංකය / உமது இலக்கம் / Your No. | | දිනය / திகதி / Date | 2022.05 ½ |
|---|---|---|---|---|---|

ලේකම්,
දේශීය වෛද්‍ය ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන හා
ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යාංශය

ප්‍රධාන ලේකම්,
(උතුරු/ නැගෙනහිර / දකුණ / සබරගමුව / ඌව / වයඹ / මධ්‍යම / උතුරු මැද) පළාත

ලේකම්,
පළාත් සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය (බ.ප)

ලේකම්,
පළාත් පාලන අමාත්‍යාංශය (බ.ප)

ආයුර්වේද කොමසාරිස්, ආයුර්වේද දෙපාර්තමේන්තුව

**<u>කොළඹ මහා නගර සභාවේ ස්වදේශීය වෛද්‍ය දෙපාර්තමේන්තුවේ හා ඖෂධ නිෂ්පාදනාගාරයේ පුරප්පාඩුව පවතින ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ තනතුරු සඳහා අයදුම්පත් කැඳවීම</u>**

කොළඹ මහා නගර සභාවේ ස්වදේශීය වෛද්‍ය දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් සහිත ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

<u>අයදුම්පත් කැඳවනු ලබන තනතුර</u>

| <u>ස්වදේශීය වෛද්‍ය දෙපාර්තමේන්තුව</u> | <u>අනුමත ශ්‍රේණිය</u> |
|---|---|
| ➢ නියෝජ්‍ය ප්‍රධාන නාගරික ආයුර්වේද වෛද්‍ය නිලධාරී | - II/I ශ්‍රේණිය |
| <u>ඖෂධ නිෂ්පාදනාගාරය</u> | |
| ➢ ආයුර්වේද නියෝජ්‍ය ප්‍රධාන නාගරික වෛද්‍ය නිලධාරී | - II/I ශ්‍රේණිය |

02. තනතුරුවලට බඳවා ගැනීමට අදාළ සුදුසුකම්

අයදුම්පත් කැඳවීම අවසන් වන දිනට පූර්වාසන්න වසර 05ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ I හෝ II ශ්‍රේණියේ නිලධාරියෙකු විය යුතුය.

03. තෝරාගනු ලබන ක්‍රමවේදය-

**02** ඡේදයේ සඳහන් සුදුසුකම් සම්පූර්ණ කරන ලද ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට භාජනය කොට ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය පදනම් කරගෙන ලකුණු ලබාදෙනු ලැබේ. එම ලකුණු ලබාදීමේ ක්‍රමවේදය මේ සමඟ අමුණා ඇති අතර ජ්‍යෙෂ්ඨතාවයට ලකුණු - 40ක් සහ කුසලතාවයට ලකුණු - 60ක් වශයෙන් උපරිම ලකුණු ප්‍රමාණයක් ලබා දෙනු ඇත.

04. නිලධාරීන් විසින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් තම ආයතන ප්‍රධානියා, දෙපාර්තමේන්තු ප්‍රධානියා හා අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශ සහිතව ඉදිරිපත් කළ යුතු වේ. එසේම තනතුරු කිහිපයකට ඉල්ලුම් කරනු ලබන්නේ නම් නිලධාරීන් විසින් ඒ සඳහා අයදුම්පත් වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් කළ යුතුය.

05. මේ සම්බන්ධයෙන් ඔබ අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ හා ඒ යටතේ ඇති ආයතන වල සේවය කරනු ලබන ආයුර්වේද වෛද්‍ය සේවයේ නිලධාරීන් දැනුවත් කර මේ සමඟ අමුණා ඇති ආකෘති පත්‍රය අනුව ඔවුන් විසින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් **2022.06.24** දිනට හෝ ඊට පෙර **" ප්‍රධාන ලේකම්, ප්‍රධාන ලේකම් කාර්යාලය (බස්නාහිර පළාත් සභාව), අංක 204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීමට දැනුවත් කරන්නේ නම් මැනවි.

06. එසේම අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම්කරනු ලබන තනතුරු සඳහන් කළ යුතුය. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන අතර, බඳවා ගැනීම සම්බන්ධයෙන් අවසාන තීරණය බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම් සතුවේ.

ජේ.එම්.සී. ජයන්ති විජේතුංග
ප්‍රධාන ලේකම්
බස්නාහිර පළාත

පිටපත්

1. පළාත් ආයුර්වේද කොමසාරිස්, පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව (බ.ප) -අ.ක.ස
2. පළාත් පාලන කොමසාරිස්, පළාත් පාලන දෙපාර්තමේන්තුව (බ.ප) -අ.ක.ස

**කොළඹ මහා නගර සභාවේ නියෝජ්‍ය ප්‍රධාන නාගරික ආයුර්වේද වෛද්‍ය නිලධාරී තනතුර හා ආයුර්වේද නියෝජ්‍ය ප්‍රධාන නාගරික වෛද්‍ය නිලධාරී තනතුරට තෝරා ගැනීමේ සම්මුඛ පරීක්ෂණයේ ලකුණු ලබාදීමේ ක්‍රමවේදය**

| | | | | |
|---|---|---|---|---|
| 1 | ජ්‍යෙෂ්ඨතාවය | උපරිම ලකුණු 40 | අයදුම්පත් යොමු කර ඇති ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ I ශ්‍රේණියේ සහ II ශ්‍රේණියේ සියලුම නිලධාරීන් සඳහා පහත පරිදි ලකුණු ලබා දෙනු ඇත.<br>II ශ්‍රේණියේ වසර 05ක සේවා කාලයට අමතරව සම්පූර්ණ කර ඇති සක්‍රිය සේවා කාලයේ,<br>එක් වසරකට ලකුණු 04 බැගින්ද,<br>මාස 06ක් හෝ ඊට වැඩි කාලයකට ලකුණු 02 බැගින්ද,<br>මාස 03ක් හෝ ඊට වැඩි කාලයකට ලකුණු 01 බැගින්ද ලබා දෙනු ලැබේ. | ලකුණු 40 |
| 2 | කුසලතාව | උපරිම ලකුණු 60 | ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ II පරිශිෂ්ඨයේ දැක්වෙන විෂය ක්ෂේත්‍රයට අදාළ හෝ ලිපියකින් අදාළ කර ගැනීමට අනුමැතිය ලබා දී ඇති<br><br>දර්ශනපති ල.15<br>පශ්චාත් උපාධින් ල.10<br>පශ්චාත් උපාධි ඩිප්ලෝමාවන් ල.05<br>ඩිප්ලෝමාවන් (මාස 6 හෝ ඊට වැඩි) ල.04<br>ඉහත එක් කාණ්ඩයක් යටතේ ඇති එක් සහතිකයක් සඳහා පමණක් ලකුණු ලබදෙනු ලැබේ | ලකුණු 15 |
| | | | ක්ෂේත්‍රයට අදාළ පළපුරුද්ද - ( ලිඛිත පත්වීම් ලිපිවලින් අදාළ කාලසීමාවන් තහවුරු විය යුතුය)<br>රෝහල් අධ්‍යක්ෂ අවු.01ට ල.02 බැගින් අවු.05 ක් සඳහා ල.10<br>වෛද්‍ය අධිකාරී අවු.01ට ල.1½ බැගින් අවු.05 ක් සඳහා ල.7 ½<br>කාර්යභාර වෛ.නිල. අවු.01ට ල.01 බැගින් අවු.05 ක් සඳහා ල.05 | ලකුණු 10 |
| | | | පරිපාලනයට අදාළ පාඨමාලා<br>මාස 6 ට වඩා වැඩිනම් - ල.05<br>මාස 3 – 6 දක්වා - ල.03<br>මාස 2 – 3 දක්වා - ල.02<br>(ලේඛනවලින් අදාළ කාලසීමාව තහවුරු විය යුතු වන අතර තහවුරු නොවන්නේ නම් ලකුණු ලබා දීමක් සිදු නොකරයි) | ලකුණු 05 |
| | | | විෂය ක්ෂේත්‍රයට අදාළව තමන් විසින් සිදු කරන ලද පර්යේෂණ - ල.01<br>විෂය ක්ෂේත්‍රයට අදාළව තමන් විසින් නිකුත් කරන ලද නිබන්ධන - ල.01<br>විෂය ක්ෂේත්‍රයට අදාළව තමන් විසින් රචනා කරන ලද ග්‍රන්ථ - ල.01<br>විෂය ක්ෂේත්‍රයට අදාළව තමන් විසින් පුවත්පතකට රචනා කරන ලද ලිපි- ල.01<br><br>විෂය ක්ෂේත්‍රයට අදාළව වාර ප්‍රකාශන සඳහා තමන් විසින් රචනා කරන ලද ලිපි - ල.01<br>(දර්ශනපති , පශ්චාත් උපාධිය හෝ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව සඳහා ඔබ විසින් ඉදිරිපත් කරන ලද, ඉහත ලේඛනවලට අමතරව මෙම ලේඛන ඉදිරිපත් කළ යුතුය. එක් අයිතමයකට උපරිම එක් ලකුණක් පමණක් ලබා දෙනු ලැබේ) | ලකුණු 05 |
| | | | තොරතුරු තාක්ෂණ පුහුණුව (රජය විසින් පිළිගත් ආයතනයකින් ලබා ගත්)<br>මාස 1 ට වඩා වැඩිනම් - ල.05<br>සති 02ට වඩා වැඩි මාස 01ට අඩු - ල.03<br>(ලේඛනවලින් අදාළ කාලසීමාව තහවුරු විය යුතු වන අතර තහවුරු නොවන්නේ නම් ලකුණු ලබා දීමක් සිදු නොකරයි) | ලකුණු 05 |
| | | | සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය හා පෞරුෂත්වය | ලකුණු 05 |
| | | | කාර්ය සාධනය, (ආසන්න වසර 05 තුළ)<br>විශිෂ්ඨ මට්ටම (ල.03)<br>සාමාන්‍ය ප්‍රමාණනයට වඩා ඉහළ (ල.02)<br>සතුටුදායක මට්ටම (ල.01)<br>(කාර්යසාධනයේ ඉහත එක වරණයක් ඇත්නම් පමණක් ලකුණු ලබාදීම සිදුකරනු ලබන අතර, වරණ කිහිපයක් ඇත්නම් කිසිදු ලකුණක් ලබා නොදේ.) | ලකුණු 15 |

(කාර්යාල ප්‍රයෝජනය සඳහා)

## ආදර්ශ අයදුම්පත්‍රය

## කොළඹ මහා නගර සභාවේ ..........................................................................

## තනතුර සඳහා බඳවා ගැනීම

01. මුලකුරු සමග නම -
02. සම්පූර්ණ නම -
03. උපන්දිනය -
04. පෞද්ගලික ලිපිනය -
05. ජාතික හැඳුනුම්පත් අංකය -
06. දුරකථන අංකය -
07. මුල් පත්වීමේ දිනය -
08. දැනට දරණ නිත්‍ය තනතුර -
09. දැනට සිටින ශ්‍රේණිය -
10. එම ශ්‍රේණියට පත්වූ දිනය -
11. වර්තමාන සේවා ස්ථානය -
12. වර්තමාන සේවා ස්ථානයේ ලිපිනය -
13. පූර්වාසන්න වසර 05 තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර - ඇත/නැත .......................
14. පූර්වාසන්න වසර 05 තුළ වැටුප් වර්ධක උපයාගෙන - ඇත/නැත ..........................
15. පූර්වාසන්න වසර 05 තුළ වැටුප් රහිත නිවාඩු ලබාගෙන - ඇත/නැත ..........................
    අ) වැටුප් රහිත නිවාඩු ලබා ඇත්නම් ඒ පිළිබඳ විස්තර ..........................................................................
16. අයදුම්පත් කැඳවීමේ අවසන් වන දිනට පූර්වාසන්න වසර 05 තුළ කාර්ය සාධනය (ආයතන ප්‍රධානියා විසින් සහතික කළ පිටපත් අමුණා එවිය යුතුය) **( සැ.යු - සලකුණු කර නොමැති කාර්යසාධන සඳහා ලකුණු ලබාදීමක් සිදු කරනු නොලැබේ.)**

| වර්ෂය | කාර්යසාධන මට්ටම (අසතුටුදායක බව/සතුටුදායක බව/ සාමාන්‍ය ප්‍රමාණයට වඩා ඉහළ බව/ විශිෂ්ඨ බව) |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |

මවිසින් ඉහත සඳහන් කර ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි.

දිනය - ......................................................
අත්සන

**ආයතන ප්‍රධානියා / දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය -**

........................................................................ මහතා / මහත්මිය / මෙනවිය සම්බන්ධයෙන් විනය පරීක්ෂණයක් පැවැත්වෙන බව / නොපැවැත්වෙන බව දන්වන අතර, ඔහු / ඇය විසින් සඳහන් කර ඇති තොරතුරු පෞද්ගලික ලිපිගොනුව අනුව නිවැරදි බව සහතික කරමි. මෙම නිලධාරියා ඉහත තනතුර සඳහා තෝරාගනු ලැබුව හොත් දැනට සිටින සේවා ස්ථානයෙන් අනුප්‍රාප්තිකයෙකු සහිතව / රහිතව මුදාහැරීමට එකඟ වෙමි / නොවෙමි.

දිනය - ......................................................
අත්සන හා නිල මුද්‍රාව

**අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය -**

ආයතන ප්‍රධානියාගේ / දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශයට එකඟ වෙමි / එකඟ නොවෙමි.

දිනය - ......................................................
අත්සන හා නිල මුද්‍රාව